ගොටුකොළ නිෂ්පාදන ගම්මානය.

මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 639 පාතකඩ ග්‍රා.නි වසමේ ග්‍රාම ශක්ති වැඩ සටහන යටතේ කෘෂී නිෂ්පාදන ගම්මානයක් ලෙස තෝරා ගෙන ඇත.

එම වසම තුල අක්කර 50 කට ආසන්න භූමි ප්‍රමාණයක ගොටුකොළ වගා කර ඇති අතර පවුල් 100 ක් පමණ දැනට සෘජුව මෙම ගොටුකොළ වගාවේ නිරත වේ.දෛනික ගොටුකොළ නිෂ්පාදනය 2500 kg ක් පමණ වන අතර 1kg ක විකුණුම් මිල රු.125 ක් පමණ වේ.මේ තුල සෘජු හා වක්‍ර රැකියා රාශියක් බිහි වී ඇති අතර පෙරට වඩා ගොවීන්ගේ හා ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්වය ඉහල ගොස් ඇත.

වසමේ සිටින ගොටුකොළ වගා කරුවන්ගේ නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම හා නව නිෂ්පාදන සඳහා ගොටුකොළ වගා කරුවන් යොමු කරනුවස් ජනාධිපති ලේකම් කාර්යාලයේ ජාතික ආහාර නිෂ්පාදන වැඩ සටහන යටතේ රුපියල් ලක්ෂ 25 කට වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා දී ඇත.

කොට්ඨාශයේ ගොවීන් අපනයන වෙළඳ පල ඉලක්ක කර ගත් නිෂ්පාදන සඳහා යොමු කිරීම හා අපනයන වෙළඳ පලට අවශ්‍යය ගොටුකොළ ප්‍රභේදයන් වගා කිරීම තුලින් ගොවීන්ගේ ආදායම හා ජීවන තත්වය නගා සිටවීම හා ගොටුකොළ නිෂ්පාදකයින්ට දේශීය මෙන්ම විදේශීය පුහුණු අවස්ථා ලබාදීම මූලික අරමුණු වේ.

*2019.06.28 වන දින ගොටුකොළ ගොවීන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වූ අතර

*2019.07.04 වන දින ගොටුකොළ ආශ්‍රිත අගය එකතු කල නිෂ්පාදන බිහිකිරීම සඳහා පුහුණු වැඩ සටහනක් ගන්නොරුව ආහාර පර්යේෂණ ඒකකයේ දී ලබා දීමට සියලු කටයුතු සුදානම් කර ඇත.